JMC vLearning
"your virtual learning partner"

# බැඳීම් සහ ක්‍රියාපටිපාටි

## AAT අදියර III

## CPT - සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

නුවන් සමීර
B.Sc. (Accountancy) Sp., CBA, ACCA Finalist

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය Estd. 1972
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# ආදායම් බදු බැඳීම් හා ක්‍රියාපටිපාටි
# (Income Tax Obligations & Procedures )

පරිච්ඡේදය 7

## ආදායම් බදු පරිපාලනය (Tax Administration)

### අන්තර්ගතය

1. ආදායම් බදු ගෙවීම
2. බදු වාර්තා සැපයීම
3. අනුමැතියලත් නියෝජිතයින්
4. තක්සේරු
5. අභියාචනා
6. බදු පැහැර හැරීම හා නැවත අයකර ගැනීම
7. වැඩිපුර ගෙවා ඇති බදු ආපසු ගෙවීම
8. දණ්ඩන විධිවිධාන

### 1. ආදායම් බදු ගෙවීම

ආදායම් බදු ගෙවීම පහත තුන් ආකාරයකට සිදු වේ.

| | |
|---|---|
| රඳවා ගැනීමේ බදු | XX |
| වාරික වශයෙන් ගෙවීම | XX |
| තක්සේරු කිරීමෙන් | XX |
| | XXX |

### 1.1 වාරික වශයෙන් ගෙවීම (ස්වයං තක්සේරුව මත)

වාරික ගෙවෙන්නෙකු සහ තැනැත්තෙු තක්සේරු වර්ෂය සඳහා පහත දක්වෙන ආකාරයට වාරික හතරකින් (04) ගෙවිය යුතුය.

තක්සේරු වර්ෂය මාර්තු 31 න් අවසන් වන්නේ නම්,

- පළමු වාරිකය - එම තක්සේරු වර්ෂයේ අගෝස්තු 15 දින හෝ ඊට පෙර
- දෙවන වාරිකය - එම තක්සේරු වර්ෂයේ නොවැම්බර් 15 දින හෝ ඊට පෙර
- තෙවන වාරිකය - එම තස්සේරු වර්ෂයේ පෙබරවාරි 15 දින හෝ ඊට පෙර
- සිව්වන වාරිකය - ඊළඟ තක්සේරු වර්ෂයේ මැයි 15 දින හෝ ඊට පෙර

JMC vLearning "your virtual learning partner"

**සටහන**

බදු ගෙවන්නාගේ ලබන ඉල්ලුම මත CGIR විසන් නියමිත දිනට වැඩි කාලයක් ලබාදිය හැකිය. නමුත් එය පොලී පැනවීමට යටත් වේ.

- ඉහත තක්සේරු වර්ෂය CGIR අනුමානය මත වෙනස් කරගෙන ඇත්නම්, කාර්තුව අවසන් වී එළඹෙන මස 15 දිනට පෙර ගෙවීම් කළ යුතුය.

### 1.1.1 බදු වාරිකය ගණනය කිරීම

වාරිකය = (තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත බද්ද - (වාරික ගෙවීම් + රඳවාගත් බදු)) / තක්සේරු වර්ෂය සඳහා ගෙවීමට ඇති ඉතිරි වාරික ගණන

- බද්ද ඇස්තමේන්තු කිරීම සඳහා ක්‍රමයක් හෝ පදනමක් පනතේ දී නොමැත.
- 2018/19 තක්සේරු වර්ෂය සඳහා පමණක් 2017/18 තක්සේරු වර්ෂයේ බදු බැඳියාවට 5% ක් එකතු කර ගෙවිය යුතු බද්ද ඇස්තමේන්තු කළ හැකිය.

### 1.1.2 ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශනය

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 91 වන වගන්තිය ප්‍රකාරව ආදායම් බද්දට යටත් සෑම තැනැත්තෙකුම යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද පිළිබඳව ඇස්තමේන්තුගත ප්‍රකාශයක්, ඉදිරිපත් කළ යුතු අතර ඇස්තමේන්තුගත බද්ද වාරික හරතකින් ගෙවීම කළ යුතුය. ඇස්තමේන්තුව පසුව වෙස් වූයේ නම්, සංශෝධිත ප්‍රකාශනයක් ඉදිරිපත් කළ යුතුය.

- පසු කාලීනව ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු ප්‍රකාශනය (02) අදාළ තක්සේරු වර්ෂය පුරා බලාපොරොත්තු වන අතර බදු වගකීම අඩු වුවහොත් හෝ වැඩි වුවහොත්, සංශෝධිත බදු ප්‍රකාශනනයක් ඉදිරිපත් කළ යුතුය.

- වර්තමාන වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බද්ද පෙර තක්සේරු වර්ෂයේ ගෙවිය යුතු ආදායම් බද්දට වඩා අඩු වන්නේ නම්, ඒ සඳහා හේතු ඉදිරිපත් කළ යුතුය.

JMC vLearning "your virtual learning partner"

**ප්‍රශ්නය - 01**

සරත් මහතා 2020/21 තක්සේරු වර්ෂය සඳහා රු. 900,000 ක් ලෙස බදු වගකීම ඇස්තමේන්තුගත කර ඇත. පළමු වාරිකය ලෙස රු. 225,000 ක් ගෙවා ඇත. 2020 නොවැම්බර් 15 දක්වා අත්තිකාරම් ආදායම් බද්ද බැර රු. 45,000 කි.

- දෙවන වාරිකය ගණනය කරන්න.
- ගෙවිය යුතු නියමිත දිනය සඳහන් කරන්න.

## 1.2 තක්සේරුව මත ගෙවිය යුතු බද්ද

- අයෝජන වත්කම් උපලබ්ධි වීමෙන් ඇතිවන ලාභය මත ගෙවිය යුතු බද්ද උපලබ්ධි වූ දින සිට මාසයක් ඇතුලත ගෙවිය යුතුය.
- අනෙකුත් තක්සේරු සඳහා බදු ගෙවීම් අදාල තක්සේරු වර්ෂය අවසන් වී මාස 06 ක් ඉක්මවීමට පෙර ගෙවිය යුතුය.
  උදා: 2020/21 තක්සේරු වර්ෂයට අදාළව 2021 සැප්තැම්බර් 30 හෝ එදිනට පෙර.

## 2. බදු වාර්තා ගොනු කිරීම (File the Tax Return )

බද්දට යටත් සෑම තැනැත්තෙකුම තක්සේරු වර්ෂය අවසාන වූ දින සිට මාස 08 ඇතුලත කොමසාරිස් ජනරාල්වරයාට බදු වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

උදාහරණ : 2020/21 තක්සේරු වර්ෂය සඳහා 2021 නොවැම්බර් 30 දින හෝ ඊට පෙර.

නමුත් පහත දැක්වෙන තැනැත්තන් බදු වාර්තාවක් ඉදිරිපත් කළ යුතු නොවේ. (Highlight this).

(a) පහත සඳහන් වාසික පුද්ගලයෙකු,
 (i) යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු බද්දක් නොමැති හෝ,

(b) තක්සේරු වර්ෂය තුල ගෙවිය යුතු බද්දක් නොමැති නිර්වාසික පුද්ගලයෙකු.

## 2.1 තැනැත්තෙකු විසින් ලියාපදිංචි වීම

දැනටමත් ලයාපදිංචි නොවූ තක්සෙරු වර්ෂය සඳහා ආදායම් වාර්තාවක් සැපයීමේ වගකීමක් පැවරෙන සෑම තැනැත්තෙකුම එම වර්ෂය සඳහා වන **පදනම් කාලපරිච්ඡේදය අවසන් වීමෙන් පසු දින තිහකට (30) නොවැඩි කාලයක් තුළ** කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියාපදිංචි විය යුතුය.

**"පදනම් කාලපරිච්ඡේදය"** යන්නෙන් ආදායම් බද්දට යටත් වන කාලපරිච්ඡේදය අදහස් වේ.

ලියාපදිංචි වූ තැනැත්තෙකු තම බදු ගෙවන්නා හඳුනාන ගැනීමේ අංකයක් (ITN) ලබාදිය යුතුය.

JMC vLearning "your virtual learning partner"

## 2.2 ප්‍රාග්ධන ලාභ බදු වාර්තාව (Return on capital gain)

ආයෝජන වත්කම් උපලබ්ධි වූ දින සිට මාසයක් ඇතුලත ප්‍රාග්ධන ලාභ වාර්තාව සැපයිය යුතුය.

## 2.3 වාර්තාවත් ගොනු කරන ලෙස නියම කරන දැන්වීම

බදු වාර්තාවක් සැපයිය යුතු තැනැත්තෙකු විසින් වාර්තාවක් නොසපයා ඇති විට කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන දැන්වීමකි.

දැන්වීම භාරදුන් දිනෙයේ සිට දින 14 ක් ඇතුලත බදු වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

## 3. තක්සේරු කිරීම් (Assessments)

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත අනුව තක්සේරු වර්ග 04 ක් හඳුනාගත හැකිය.

1. ---------------------------------------------------------- (Self assessment)
2. ---------------------------------------------------------- (Default assessment)
3. ---------------------------------------------------------- (Prior assessment)
4. ---------------------------------------------------------- (Amended assessment)

**ප්‍රශ්නය - 02**

(1) පැහැර හරින ලද තක්සේරුවන අන්තර්ගත විය යුතු කරුණු මොනවාද?

(2) පෙර තක්සේරුවන අන්තර්ගත විය යුතු කරුණු මොනවාද?

## 3.1 කාල කඩඉම් ප්‍රතිපාදන (Time bar)

සහකාර කොමසාරිස්වරයාට පහත දැක්වෙන කාලසීමාවන්ට යටත්ව මුල් තක්සේරුව සංශෝධනය කර සංශෝධිත හෝ අතිරේක තක්සේරුවක් නිකුත් කල යුතුය.

- බදු ගෙවන්නා හෝ බදු ගෙවන්නා වෙනුවෙන් කළ වංචාව හෝ බරපතල හෝ චේතනික නොසලකා හැරීම යන අවස්ථාවලදී ඕනෑම අවස්ථාවකදී හෝ,
- වෙනත් යම් අවස්ථාවකදී
  - (i) ස්වයං තක්සේරුවක් සම්බන්ධයෙන් වන විට, ස්වයං තක්සේරු වාර්තාව ගොනු කළ දිනෙන් හෝ
  - (ii) බොහෝ තක්සේරුවක් සම්බන්ධයෙන් වන විට, තක්සේරු දැන්වීම බදු ගෙවන්නාට බාර දුන් දින සිට

මාස 30 ක් ඇතුල සංශෝධිත / අතිරේක තක්සේරුවක් නිකුත් කළ හැකිය.

සංශෝධිත තක්සේරුවක් නිකුත් කර ඇති විටෙක වුවද,

(i) * ස්වයං තක්සේරුවක් සම්බන්ධයෙන් වන විට, ස්වයං තක්සේරු වාර්තාව ගොනු කළ දිනෙන් හෝ,

* වෙනත් තක්සේරුවක් සම්බන්ධ වන විට, තක්සේරු දැන්වීම බදු ගෙවන්නාට බාර දුන් දින සිට වසර 04 ක් හෝ ,

(ii) සංශෝධිත තක්සේරු දැන්වීම බාරදීමෙන් වසරක් (අවුරුදු 01) යන දිනයන්ගෙන් පසුව එළඹෙන දින දක්වා දැනටමත් නිකුත් කරන ලද සංශෝධිත තක්සේරුව හෝ මුල් තක්සේරුව තවදුරටත් සංශෝධනය කළ හැකිය.

## 4. විරෝධතා සහ අභියාචනා (Tax Appeal)

සෑම බදු ගෙවන්නෙකුටම අභියාචනා ක්‍රියා පටිපාටිය සඳහා **<u>"බලයලත් නියෝජිතයෙකුගේ"</u>** සේවය ලබා ගැනීමට හැකියාව ඇත.

ඒ අනුව 195 වගන්තියට අනුව බලයලත් නියෝජිතයින් පහත පරිදි වේ.

(අ) කවර හෝ විටකදී

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු
- නීතිඥවරයෙකු
- ඒ තැනැත්තා නිතිපතා සේවයෙහි නියුක්ත කරගත් සේවකයෙකු
- ශ්‍රී ලංකා බදුකරණ කාර්යයාතනයේ සාමාජිකයෙකු
- විගණකවරයෙකු ලෙස ලියාපදිංචි වී සිටින පුද්ගලයෙකු

(ආ) පුද්ගලයෙකු සම්බන්ධ වන විට, ඔහුගේ ඥාතියෙකු,

(ඇ) සමාගමක් සම්බන්ධව වන විට ඒ සමාගමේ අධ්‍යක්‍ෂවරයෙකු හෝ ලේකම්වරයා

(ඈ) හවුල් ව්‍යාපාරයක් සම්බන්ධව වන විට, ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවෙකු

(ඉ) පුද්ගල මණ්ඩලයක් සම්බන්ධ වන විට, ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයෙකු

## 4.1 අභියාචනා කිරීමේ අනුපිළිවෙල

(a) කොමසාරිස් ජනරාල්වරයාට අභියාචනා කිරීම (පරිපාලන සමාලෝචනය) - (Administrtive Appeal)

(b) බදු අභායාචනා කොමිසමට අභියාචනා කිරීම (Appeal to tax appeal commission)

(c) අභියාචනාධිකරණයට අභියාචනා කිරීම (Appeal to court of appeal)

ඉහත අනුපිළිවෙලටම අභියාචනය කළ යුතුය.



JMC vLearning "your virtual learning partner"

## 4.1 (a) පරිපාලන සමාලෝචනය (Administrative appeal)

- තක්සේරු කිරීමකින් හෝ වෙනත් තීරණයකින් අතෘප්තියට පත් බදු ගෙවන්නාට එම තීරණය සම්බන්ධව සමාලෝචනය කිරීම සඳහා කොටසකින් ජනරාල්වරයාට ඉල්ලීමක් කළ හැකිය.
- එම තීරණය බදු ගෙවන්නාට දැනුම් දී දින 30 ක් ඇතුලත සමාලෝචනය සඳහා ඉල්ලීම ලිඛිතව කොමසාරිස් ජනරාල්වරයා වෙත කළ යුතුය.
- සෑම ඉල්ලීමක්ම එම ඉල්ලීම ලැබීමෙන් දින 30 ක් ඇතුලත ලද බවට දැනුම් දිය යුතු අතර, එසේ දැනුම් දුන් අවස්ථාවේදී දැනුම්දීමේ ලිපියේ දිනය එම ඉල්ලීම ලද දිනය ලෙස සැලකේ.
- කොමසාරිස් ජනරාල්වරයාට පැවරෙන තක්සේරුව තහවුරු කිරීමට, සංශෝධිත තක්සේරුවක් නිකුත් කිරීමට හෝ අතිරේක තක්සේරුවක් නිකුත් කිරීමට බලය පවතී.

## 4.1 (b) බදු අභියාචනා කොමිසමට අභියාචනය කිරීම

- පරිපාලන සමාලෝචනයෙන් ලද තීරණය පිළිබඳව අතෘප්තිමත් තැනැත්තෙකුට එම තීරණයකට විරුද්ධව බදු අභියාචනා කොමිසමට අභියාචනා කළ හැකිය.
- පහත අවස්ථාවලදී පමණක් බදු අභියාචනා කොමිසමට අභියාචනය කළ හැකිය.
  1. පරිපාලන සමාලෝචනය සඳහා අභියාචනා කර තිබීම හා තීරණයක් ලැබී තිබීම.
  2. පරිපාලන සමාලෝචනයක් කර ඇතත් කොමසාරිස් ජනරාල්වරයාගෙන් දින 90 ක් තුල තීරණයක් ලැබී නොතිබීම.
- කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය ලැබී ඇත්නම් තීරණය ලද දින සිට දින 30 ක් ඇතුලත් කොමසාරිස් ජනරාල්වරයාට පිටපතක් සහිතව බදු අභියාචනා කොමිසමට අභියාචනා දැන්වීම ඉදිරිපත් කළ යුතුය.

## 4.1 (c) අභියාචනාධිකරණයට අභියාචනා කිරීම

- බදු අභායාචනා කොමිෂන් සභාවේ තීරණයක් පිළිබඳව අතෘප්තියට පත් පාර්ශවයකට, එම තීරණය පිළිබඳව අභියාචනාධිකරණයට අභියාචනය කළ හැකිය.
- අභියාචනාධිකරණයට අභියාචනා කිරීම සිදු කළ හැක්කේ පහත අවස්ථාවකදී පමණි.
  1. අභියාචනා කොමිෂන් සභාවට අභියාචනය කර ඉන් තීරණයක් ලැබී තිබීම හෝ
  2. අභියාචනා කොමිෂන් සභාවට අභියාචනය කර දින 90 ක් ඉක්මවා ඇතත් තීරණයක් දැනුම් දී නොමැති අවස්ථාවකදී

JMC vLearning "your virtual learning partner"

- අභියාචනා කොමිසමේ තීරණය ලැබී ඇති අවස්ථාවකදී එම තීරණය දැනුම් දීමෙන් පසු දින 30 ක් ඇතුලත අභියාචනාධිකරණයට අභියාචනා දැන්වීමක් භාර දිය යුතුය. පිටපතක් අභියාචනා කොමිසමටද ලබා දිය යුතුය.

### විශේෂ සටහන

- පහත සඳහන් අවස්ථාවලදී තීරණ ලැබී දින 30 ට වඩා ඉක්මවුවද බදු ගෙවන්නාට අභියාචනය කිරීමට ඉඩකඩ ලබා දේ.
  1. ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම.
  2. රෝගාතුර වීම.
  3. වෙනත් පිළිගත හැකි සාධාරණ හේතුවක් මත (CGIR තීරණ කරන ලබනු අවස්ථාවකදී)

## 4.2 තක්සේරුවේ අවසානාත්මක බව

ඉහතින් සඳහන් කරන ලද අවස්ථාවලදී හැර තීරණය ලද දින සිට 30 ක් ඇතුලත් අභියාචනා දැන්වීමක් ඉදිරිපත් නොකිරීම මත ලබා දුන් තක්සේරුව ස්ථිර වන අතර, එය තක්සේරුවේ අවසානාත්මක බව වේ.

## 5. පැහැර හරින ලද බදු (Default in tax payment )

ගෙවිය යුතු බද්දක් ගෙවීමට නියමිත දිනයේදී බදු නොගෙවා ඇති විටකදී 152 වන වගන්තිය අනුව පැහැර හරින ලද බද්දක් ලෙස අර්ථකතනය කරනු ලබයි.

බදු ගෙවන ලෙස ඉල්ලා කරන දැන්වීමට පහත දෑ අන්තර්ගත වේ. (පැහැර හරින ලද බදු දැන්වීම).

a) බදු ගෙවන්නාගේ නම

b) බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය

c) දැන්වීම නිකුත් කළ දිනය

d) ගෙවිය යුතු බදු ප්‍රමාණය, පොලිය, දඩ මුදල සහ ඊට අදාළ වන කාලපරිච්ඡේදය

e) එම ප්‍රමාණයන් ගෙවන ලෙස කරනු ලබන ඉල්ලීමක්

f) ගෙවීම සිදු කළ යුතු ස්ථානය

නිවේදනයේ සඳහන් දින සිට දින 21 තුල ගෙවීම් නොකළහොත් බදු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමට CGIR අයිතියක් ඇත.

නමුත් CGIR විශේෂ අවසරය මත එම දින 21 සීමාව සඳහා සහන කාලයක් ලබාගත හැකිය.

## 5.1 බදු අයකර ගැනීම

බදු ගෙවන්නා බදු පැහැර ඇති බවට නිශ්චය කරනු ලැබූ දින සිට වසර පහක් (05) ඇතුලත බදු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කල යුතුය.

❖ ඒ අනුව පැහැර ලද බදු පහත ආකාරයෙන්ම අයකරගත හැකිය.
  - අමාත්‍ය අනුමැතිය මත එය රජයට අයවිය යුතු ණයෙන් ලෙස සලකා එය ශුන්‍ය කල හැකිය.
  - අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම.
  - බදු ගෙවන්නාගේ දේපල රජයට පවරා ගැනීම.
  - බදු ගෙවන්නාගේ දේපල තහනම් කිරීම හා විකිණීම.
  - බදු ගෙවන්නාට රටින් පිටවීමට නොහැකි ලෙස ආගමන විගමන තහනමක් පැනවීම.
  - ගෙවීම්වලින් හිලව් කර ගැනීම.
  - තෙවන පාර්ශව ණයකරුවන්ගෙන් අයකර ගැනීම.

## 5.2 ආපසු ගෙවීම

1. බදු ගෙවන්නෙකු විසින් ගෙවන ලද බදු ප්‍රමාණය, තක්සේරු කරන ලද බදු ප්‍රමාණය හෝ ගෙවනු ලැබිය යුතු යයි සොයාගත් ප්‍රමාණය ඉක්මවන අවස්ථාවක, එය ආපසු ගෙවීමක් ලෙස සැලකේ.

2. ආපසු ගෙවීමේ ඉල්ලීමක් කල යුතු පරාජය කුමක්ද?

   - ගෙවීමේ දිනයේ සිට වසර හතරක් (04) ඇතුළත ආපසු ගෙවීම සඳහා ආයඳුම් කළ යුතු වේ.

3. බදු ආපසු ගෙවීම් සඳහා හිලව් කළ හැක්කේ මොනවාද?

   - ආදායම් බදු පොලී, ප්‍රමාද ගාස්තු හෝ දඩ සඳහා වූ තක්සේරුගත බැඳීමට හිලව් කරයි.
   - බදු ගෙවන්නාගේ විරෝධතාවක් නොමැති නම් පමණක් ඉදිරි මාස 06 ක ඇතුලත ගෙවිය යුතු වන බදු සඳහා, පෙර ගෙවීම් ලෙස හිලව් කළ හැකිය.

## 5.3 දණ්ඩනීය විධිවිධාන

5.3.1 පැහැර හරින ලද බදු සහ ඒ මත දණ්ඩන (176 වගන්තිය)

| වරද | දණ්ඩනය |
|---|---|
| ගෙවීමට නියමිත මුළු වාරිකය හෝ ඉන් කොටසක් නියමිත දින සිට දින 14 ක් ඇතුලත් නොගෙවීම. | ගෙවිය යුතු නමුත් නොගෙවූ බද්දෙන් 10% |
| බදු කාලපරිච්ඡේදයක් සඳහා නියමිත වෙනත් බද්දක් නොගෙවීම.<br><br>නියමිත දිනෙන් දින 14 ක් හෝ තක්සේරු දැන්වීමේ දක්වා ඇති දිනය වන විට නොගෙවීම. | ගෙවිය යුතු නමුත් නොගෙවූ බද්දෙන් 20% |
| නොසැලකිලිමත් ලෙස හෝ වංචානික ලෙස අඩුවෙන් කරන ලද ගෙවීම්. | අඩුවෙන් කල ගෙවීම රු. මිලියන 10 ට වඩා වැඩිනම් හෝ අදාල කාලසීමාවේ බදු බැඳියාවෙන් 25% වඩා වැඩිනම්, අඩුවෙන් කල ගෙවීමෙන 75%.<br><br>අනෙකුත් අවස්ථාවලදී අඩුවෙන් කල ගෙවීමෙන් 25% |

5.3.2 පැහැර හරින ලද බදු සහ ඒ මත දණ්ඩන (176 වගන්තිය)

| වරද | දණ්ඩනය |
|---|---|
| බදු වාර්තා ප්‍රමාද වී ගොනු කිරීම. | 1. ගෙවීමට ඇති බදු මුදලින් 5% ක් සමග වාර්තාව ගොනු කරන තෙක් එක් මාසයක් හෝ ඉන් කොටසක් සඳහා ගෙවීමට ඇති බදු මුදලින් 1% ක් සහ<br><br>2. රු. 50,000 සහ වාර්තාව ගොනු කරන තෙක් එක් මාසයක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10,000 ක් යන දෙකෙන් වැඩි මුදල. නමුත් දණ්ඩනය රු. 400,000 නොඉක්මපිය යුතුය. |

5.3.3 වෙනත් වැරදි සඳහා දණ්ඩන (181 වගන්තිය)

| වරද | දණ්ඩනය |
|---|---|
| බදු නිළධාරියෙකුට අසත්‍ය හෝ නොමඟ යවන සුලු ප්‍රකාශයක් සැපයීම. (181 Section) | රු. 50,000 ක් හෝ එම අසත්‍ය තොරතුරු නිසා ගෙවිය යුතු බද්ද අඩුවන ප්‍රමාණය යුතු බද්ද අඩුවන ප්‍රමාණය හෝ ආපසු ලැබිය යුතු ප්‍රමාණය වැඩි වන ප්‍රමාණය යන අගයන්යන්ගෙන් වඩා වැඩි වන ප්‍රමාණය. |
| ලේඛන පවත්වාගෙන යාමට අපොහොසත් වීම. | එම අපොහොසත් වීම අඛණ්ඩව සිදුවන දිනකට රු. 1,000 බැගින්. |
| බදු නිලධාරියෙකුට පහසුකම් සැලසීමට අපොහොසත් වීම. (182 Section) | රු. 10,000 නොඉක්මවන දණ්ඩනයක්. |

**ප්‍රශ්නය**

වාර්තාව සැපයීමට අපොහොසත් වීම මත කොමසාරිස් ජනරාල්වරයාට අයකළ හැකි උපරිම දණ්ඩනය කොපමණද?

JMC vLearning "your virtual learning partner"

**සැකසුම: නුවන් සමීර**